මාධ්‍ය නිවේදන අංක 16

**මැතිවරණ කොමිෂන් සභාව**

**පාර්ලිමේන්තු මැතිවරණය - 2020**

2020 මාර්තු මස 16 වන සඳුදා දින රජයේ නිවාඩු දිනයක් බවට රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු විෂය භාර අමාත්‍යවරයා විසින් නියම කර ඇති බැවින්, පාර්ලිමේන්තු මැතිවරණය සඳහා ඇප මුදල් භාර ගැනීම හෝ නාමයෝජනා භාර ගැනීම මාර්තු 16 දින සිදු නොකරන බව මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙන් මෙයින් ප්‍රකාශ කර සිටිනු ලැබේ.

මෙයට පෙර නිවේදනය කළ පරිදි මාර්තු 17, 18 යන දින දෙකෙහි කාර්යාල වේලාවන් තුළ හා මාර්තු 19 දින පෙරවරු 8.30 සිට මධ්‍යාහ්න 12.00 දක්වා ඇප මුදල් භාර ගැනීම හා නාමයෝජනා භාර ගැනීම සිදු කෙරෙනු ඇති බව ද වැඩිදුරටත් දන්වා සිටිනු ලැබේ.

මාර්තු 19 දින නාමයෝජනා හා විරෝධතා පිළිබඳව කටයුතු අවසන් වූ පසු 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 24 (1) වගන්තිය යටතේ මැතිවරණ කොමිෂන් සභාව විසින් ඡන්ද විමසීමේ දැන්වීම නිකුත් කරනු ඇත.

මාර්තු 16 දින රජයේ නිවාඩු දිනයක් ලෙස ප්‍රකාශ කර ඇති බැවින් තැපැල් ඡන්ද අයදුම්පත් මාර්තු 17 දින මධ්‍යම රාත්‍රී 12.00 දක්වා භාර ගැනීමට සියළුම තේරීම්භාර නිලධාරීවරුන්ට සහ නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ට උපදෙස් දී ඇති බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

මහින්ද දේශප්‍රිය
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.
2020.03.15